# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2309/04 - 2022 දෙසැම්බර් මස 05 වැනි සඳුදා - 2022.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1934 පෙබරවාරි 05 වැනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 51 වගන්තිය යටතේ වූ නිවේදනයයි.

### නිවේදනය

කලින් කල සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ, 17 වන වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කර පහත නව වගන්තිය ආදේශ කිරීමෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

17. "පනස් පස් හැවිරිදි වයස පිරුණු විට හෝ ඉන් පසුව හෝ ආණ්ඩුවේ ඕනෑම සේවකයෙකුට ආණ්ඩුවේ සේවයෙන් විශ්‍රාම ගැනීමට නියම කරන්නට පුලුවන, නියම බලධාරී කෙනෙකු විසින් සේවයේ රඳවා ගැනීමට තීරණය කළ හොත් මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ වෙනත් නීතියක් මගින් හෝ අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස නිශ්චිතව තීරණය කර ඇති නිලධරයන් හැර, සියලුම සිවිල් රාජ්‍ය නිලධරයන් හැට වයස පිරුණු විට අනිවාර්යයෙන්ම සේවයෙන් විශ්‍රාම ගත යුතු ය.".

මෙම නියෝගය 2023 ජනවාරි 01 දින සිට බලාත්මක විය යුතු ය.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය හා
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 නොවැම්බර් මස 30 දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

EOG 12 - 0063

1A - G 38256 — 8 (2022/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.